සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

8053

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

# වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2019
**Year End Evaluation**

| | | |
|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade | 08 | |
| විෂයය / பாடம் / Subject | බුද්ධ ධර්මය | |
| පත්‍රය / வினாத்தாள் / Paper | I ,II | |
| කාලය / காலம் / Time | පැය 02යි. | |

නම : .................................................................................. විභාග අංකය : ......................................................

## I කොටස

සැලකිය යුතුයි :

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 20 දක්වා දී ඇති ප්‍රශ්නවලට වඩාත් ම සුදුසු නිවැරදි පිළිතුර තෝරා ඒ යටින් ඉරක් අඳින්න.

(1) "හිරි හා ඔත්තප්ප" ධර්මයෙහි හැඳින්වෙන්නේ,
1. අධිපති ධර්ම නමිනි.
2. අත්තූපනායික ධර්ම නමිනි.
3. අපරිහානි ධර්ම නමිනි.
4. ලෝක පාලක ධර්ම නමිනි.

(2) සිරි දළදා වහන්සේ ලක්දිවට වැඩම කරවන ලද්දේ,
1. සංඝමිත්තා තෙරණිය විසිනි.
2. මිහිඳු මහ රහතන් වහන්සේ විසිනි.
3. දන්ත කුමරු හා හේමමාලා කුමරිය විසිනි.
4. අරිට්ඨ කුමාරයා විසිනි.

(3) බෝසතාණන් වහන්සේ උතුම් බුදු බව පතා පාරමිතා සම්පූර්ණ කළ අයුරු ජාතක කතා තුළින් විස්තර වෙයි. ඒ අනුව උම්මග්ග ජාතකයෙන් ප්‍රකට වන්නේ,
1. දාන පාරමිතාවයි.
2. සීල පාරමිතාවයි.
3. ප්‍රඥා පාරමිතාවයි.
4. උපේක්ඛා පාරමිතාවයි.

(4) ආගමික සහජීවනය බුදු දහමේ උසස් ගුණයක් ලෙස අගය කර ඇත. ඒ අනුව ඔබ කළ යුත්තේ,
1. සියලු ආගම් ඇදහීමයි.
2. අන්‍ය ආගම් හෙළා නොදැකීමයි.
3. අන්‍ය ආගම් හෙළා දැකීමයි.
4. කිසිදු ආගමක් නොඇදහීමයි.

(5) යහපත් අවවාද පිළිගැනීම උතුම් ගුණාංගයකි. එසේ අවවාද පිළිගෙන කටයුතු කර උතුම් රහත්භාවය ලැබූ හිමිනමක් වූයේ,
1. රේවත හිමියන් ය.
2. සම්මුඤ්ජනි හිමියන් ය.
3. අංගුලිමාල හිමියන් ය.
4. පුණ්ණ හිමියන් ය.

(6) උපසම්පන්න භික්ෂූන් වහන්සේලාට වැසි කාලයේ වස් සමාදන් වී වැඩ සිටීමට විනය නීතියක් පැනවීමෙන් බුදු සිරිතෙහි ප්‍රකට වන ආචාරශීලී ගුණාංගය කුමක්ද?
1. මහජන මතයට ගරු කිරීමයි.
2. ආගන්තුක සත්කාරයයි.
3. අල්පේච්ඡතාවයි.
4. අල්ප ශබ්දතාවයි.

(7) අන් සියල්ල පසෙකලා ධර්මය තම සිතට නගා ගැනීමට සුදුසු වන හෙයින්,

1. අකාලික නම් වේ.
2. ඕපනයික නම් වේ.
3. සන්දිට්ඨික නම් වේ.
4. ඒහිපස්සික නම් වේ.

(8) "යෙ ධම්මා හේතුප්පභවා - තේසං හේතුං තථාගතො ආහ...." යන ගාථාවෙන් තම ගුරුවරයාත්, ගුරුවරයාගේ දහමත් හඳුන්වා දුන්නේ,

1. අස්සජි හිමියන් විසින් කෝලිතට ය.
2. සංජය පිරිවැජියා විසින් උපතිස්සට ය.
3. අස්සජි හිමියන් විසින් සංජය පිරිවැජියාට ය.
4. අස්සජි හිමියන් විසින් උපතිස්සට ය.

(9) බෞද්ධයාගේ හස්ථසාර ග්‍රන්ථය වන්නේ,

1. ධම්ම පදය ය.
2. පිරුවානා පොත් වහන්සේ ය.
3. පන්සිය පනස් ජාතක පොත් වහන්සේ ය.
4. මහා වංශය ය.

(10) භික්ෂුණී ශාසනයට ඇතුළත් වූ පළමු කාන්තාව වූයේ,

1. යසෝදරා දේවියයි.
2. ප්‍රජාපතී ගෝතමී දේවියයි.
3. ඛේමා දේවියයි.
4. අනුලා දේවියයි.

(11) ආයුක්ඛය, කම්මක්ඛය, උභයක්ඛය, උපච්ඡේදක යනුවෙන් බුදු දහමේ පෙන්වා දෙන්නේ,

1. අකුසල් විපාක දෙන ක්‍රම සතරකි.
2. කුසල් විපාක දෙන ක්‍රම සතරකි.
3. මරණය සිදු වන ක්‍රම සතරකි.
4. පුද්ගලයාට මුහුණ දීමට සිදුවන දුක් සතරකි.

(12) කරන කලට පව් මිහිරිය මීසේ
විඳින කලට දුක් දැඩිවෙයි ගිනි සේ ... ආදී වූ පද්‍ය ඇතුළත් ග්‍රන්ථය වන්නේ,

1. සුභාෂිතයයි.
2. ලෝකෝපකාරයයි.
3. බුදුගුණ අලංකාරයයි.
4. ලෝවැඩ සඟරාවයි.

(13) අලුත් සහල් මංගල්‍යය, අලුත් අවුරුදු මංගල්‍යය, ඇසළ මංගල්‍යය, කාර්තික මංගල්‍යය යනුවෙන් හැඳින්වෙන සතර මහා මංගල්‍යය නම් වූ ප්‍රධාන පූජාවන් වාර්ෂිකව සිදු කරනු ලබන්නේ,

1. ශ්‍රී මහා බෝධීන් වහන්සේට ය.
2. ශ්‍රී දළදා වහන්සේට ය.
3. ශ්‍රී පාදස්ථානයට ය.
4. ශ්‍රී කතරගම දේවාලයට ය.

(14) භික්ෂූන් වහන්සේලාගේ ප්‍රසාද ජනක පැවැත්ම උදෙසා බුදුරජාණන් වහන්සේ දේශනා කළ ඉතා උසස් ආචාර ධර්ම පද්ධතිය හඳුන්වනු ලබන්නේ,

1. සේඛියා ධර්ම නමිනි.
2. බෝධිපාක්ෂික ධර්ම නමිනි.
3. බොජ්ඣංග ධර්ම නමිනි.
4. ඉන්ද්‍රිය ධර්ම නමිනි.

(15) ඇස, කන ආදී ඉන්ද්‍රියයන් රූප, ශබ්ද ආදී අරමුණු මගින් පිනවීමට ඇති ආශාව නම්,

1. කාම තණ්හාවයි.
2. භව තණ්හාවයි.
3. විභව තණ්හාවයි.
4. ත්‍රිවිධ තණ්හාවයි.

(16) සිතින් සිදු වන අකුසල කර්මයකි.

1. ප්‍රාණඝාතය.
2. අදත්තාදානය.
3. ව්‍යාපාදය.
4. කාමමිථ්‍යාචාරය.

(17) බුදුරජාණන් වහන්සේගේ ප්‍රශංසාවට ලක් වූ, වජ්ජී රජවරුන් අනුගමනය කළ රාජ්‍ය ප්‍රතිපත්තිය නම්,

1. දසරාජ ධර්ම වේ.
2. දස සක්විතිවත් වේ.
3. සතර සංග්‍රහ වස්තු වේ.
4. සප්ත අපරිහානි ධර්ම වේ.

(18) ගිහියාගේ නිත්‍ය ශීලය වන්නේ,

1. පන්සිල් ය.
2. අටසිල් ය.
3. නවාංග උපෝසථ සිල් ය.
4. ගිහි දසසිල් ය.

(19) මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ඛා යනු,

1. සතර බ්‍රහ්ම විහරණ ය.
2. සතර සංග්‍රහ වස්තූන් ය.
3. සතර සංවර සීලය ය.
4. සතර සෘද්ධිපාද ය.

(20) ඕවාද සිප්ප දානේන - සික්ඛාපේති මමං ගරු ....
යනාදි ගාථාවෙන් වන්දනා කරනු ලබන්නේ,

1. දෙමව්පියන්ට ය.
2. වැඩිහිටියන්ට ය.
3. භික්ෂූන් වහන්සේලාට ය.
4. ගුරුවරුන්ට ය.

(ලකුණු 2 × 20 = 40)

## II කොටස

- **පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.**
- **පළමු ප්‍රශ්නයට ලකුණු 20 ක් ද අනිකුත් ප්‍රශ්න සඳහා ලකුණු 10 බැගින් ද හිමි වෙයි.**

---

(01) ඔබ පන්ති කාමරයේ දී තුන්වන වාර ඇගයීමට අදාළව පැවැත් වූ "දම් සභා මණ්ඩපය" ඇසුරු කර ගනිමින් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) ඔබ ඉහත ක්‍රියාකාරකම සඳහා උපයෝගී කරගත් පෙළ පොතෙහි සඳහන් පාඩමේ නම කුමක් ද?

(ii) එහිදී සාකච්ඡා කළ දහම් කරුණු දෙකක් ලියන්න.

(iii) දම් සභා මණ්ඩපයකට සහභාගී වීමේදී ඔබ විසින් අනුගමනය කළ යුතු ආචාර ධර්ම දෙකක් සඳහන් කරන්න.

(iv) ශාසන ඉතිහාසයේ සඳහන් වන ප්‍රථම ධර්ම සංගායනාවේ මූලිකත්වය දැරූ රහතන් වහන්සේ සහ අනුග්‍රහය දැක්වූ රජතුමා නම් කරන්න.

(v) එම ධර්ම සංගායනාව පැවැත්වූයේ කොහිදී ද?

(vi) සංගායනාව පැවැත්වීමට හේතු වූ ආසන්නතම හේතුව කුමක් ද?

(vii) සංගායනාව පවත්වනු ලැබූයේ බුද්ධ පරිනිර්වාණයෙන් කොපමණ කලකට පසුව ද?

(viii) සංගායනාව පැවැත්වීමේදී ධර්මය හා විනය ප්‍රශ්නවලට පිළිතුරු ලබාදීමේ වගකීම හිමි වූ රහතන් වහන්සේලා දෙනම නම් කරන්න.

(ix) ධර්ම සංගායනාවේ ප්‍රතිඵලයක් ලෙස ධර්මය නිකාය පහකට බෙදන ලදී. ඉන් දෙකක් නම් කරන්න.

(x) ධර්ම සංගායනාව ආදර්ශයට ගෙන ඔබට ඇතිවන යම් සමාජ ගැටලුවක් විසඳා ගැනීමට අනුගමනය කළ හැකි ක්‍රියා මාර්ග දෙකක් ලියන්න.

(ලකුණු 2 × 10 = 20)

(02) අසීමිත වූ බුදු ගුණ කල්පයක් පුරා සජ්ඣායනා කළ ද අවසන් කළ නොහැකිය.

(i) නව අරහාදී බුදු ගුණ අතුරින් දෙකක් ලියන්න. (ල. 2)

(ii) නෙත සැනසිල්ල බුදු හිමි රුව දකීමය......... මෙම පද්‍යයේ ඉතිරි පද තුන සම්පූර්ණ කරන්න. (ල. 3)

(iii) බුදු ගුණ භාවනාව පුහුණු කිරීමෙන් ඔබට ලබාගත හැකි ප්‍රයෝජන පහක් පෙන්වා දෙන්න. (ල. 5)

(03) "ජීවිතය සුවඳවත් වන්නේ හොඳ මිතුරන් ඇසුරු කිරීමෙනි"

(i) සදිසා නමස්කාරය පිළිබඳව බෞද්ධ ඉගැන්වීම ඇතුළත් සූත්‍ර දේශනාව කුමක් ද? (ල. 2)

(ii) හිත මිතුරන් ඇසුරු කිරීමේදී අප අනුගමනය කළ යුතු පිළිවෙත් 5ක් සිගාලෝවාද සූත්‍රයෙහි දක්වෙයි. ඉන් තුනක් ලියන්න. (ල. 3)

(iii) කල්‍යාණ මිතුරන් ඇසුරු කිරීමෙන් ඔබට ලැබෙන ප්‍රයෝජන 5 ක් පෙන්වා දෙන්න. (ල. 5)

(04) "දුක හැඳින නුවණින් ගත කරමු"

(i) චතුරාර්ය සත්‍යය පිළිබඳව ඉගැන්වෙන බෞද්ධ සූත්‍ර දේශනාවක් නම් කරන්න. (ල. 2)

(ii) පුරාණාචාර්යවරු උගන්වා ඇති පරිදි දුක්ඛ ආර්ය සත්‍ය පිළිබඳ ආකාර තුන මොනවා ද? (ල. 3)

(iii) දුක්ඛ ආර්ය සත්‍යයෙන් පෙන්වා දෙන අට වැදෑරුම් දුක් අතුරින් පහක් ලියන්න. (ල. 5)

(05) ජීවිතය සාර්ථක කර ගැනීම උදෙසා බලපාන කරුණු 38 ක් මහා මංගල සූත්‍රයෙන් අපට උගන්වා ඇත.

(i) බුදුරජාණන් වහන්සේගෙන් මංගල කරුණු පිළිබඳව විමසා සිටියේ කවරෙකු විසින් ද? (ල. 2)

(ii) එදා දඹදිව වැසියන් මංගල ලෙස පිළිගත් කරුණු තුන මොනවාද? (ල. 3)

(iii) ළමා කාලය සාර්ථක කර ගැනීම උදෙසා වඩාත් අදාළ වන මංගල කරුණු පහක් පෙන්වා දෙන්න. (ල. 5)

(06) සසර රැස් කරගත් අපමණ කුසල් බලයෙන් අගසව් පදවි ලැබූ මහරහතන් වහන්සේලා දෙනමගේ චරිතයෙන් අපට මනා පූර්වාදර්ශයන් සපයයි.

(i) අග්‍ර ශ්‍රාවක තනතුරුවලට අමතරව සැරියුත්, මුගලන් මහ රහතන් වහන්සේලා බුදු සසුනෙහි ලැබූ අග තනතුරු දෙක නම් කරන්න. (ල. 2)

(ii) මුගලන් මහ රහතන් වහන්සේගේ අසීමිත බලය උපයෝගී කරගනිමින් සම්බුද්ධ ශාසනය වෙනුවෙන් ඉටු කළ පරමාදර්ශී කාර්යයන් තුනක් ලියන්න. (ල. 3)

(iii) අගසව් මහ රහතන් වහන්සේලා දෙනමගේ චරිතයෙන් ඔබට ලබාගත හැකි ආදර්ශ පහක් පෙන්වා දෙන්න. (ල. 5)

(07) ලෞකික ජීවිතය සැපවත් කර ගැනීමට අවශ්‍ය බොහෝ උපදෙස් බෞද්ධ සූත්‍ර දේශනාවන් මගින් අපට උගන්වා ඇත.

(i) අනණ සූත්‍රයේ සඳහන් පරිදි ගිහියන් විසින් උපදවා ගත යුතු සැප හතර මොනවා ද? (ල. 2)

(ii) බුදු දහමින් අනුමත ධාර්මික රැකියාවන් 3 ක් ලියන්න. (ල. 3)

(iii) නොකළ යුතු වෙළඳාම් ලෙස බුදු දහමේ හඳුන්වා දෙන වෙළඳාම් පහ මොනවා ද? (ල. 5)